ක්‍රියාකාරකම 4

ශ්‍රේණිය: 7

වාරය : iii

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ පන් හා නියද කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි.

ක්‍රියාකාරකම = පන් හා නියද කර්මාන්තය පිළිබඳ දැනගනිමු, උගනිමු.

කියවීම සඳහා පත්‍රිකාව

- පන් හා පැදුරු කර්මාන්තය ඈත අතීතයේ සිට පැවත එන කර්මාන්තයකි.
- දුම්බර ප්‍රදේශය පැදුරු කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධ වේ.
- පන් කර්මාන්තය පවතින ප්‍රදේශ

කළුතර , රත්නපුර , ගම්පහ ,ගාල්ල

- විවීම සඳහා ගන්නා කොළ වර්ග

පන්, පොතු පන්, හැවන්, ගල්ලැහැ, තල කොළ, පොල් කොළ

- විවීම සඳහා ගන්නා කෙඳි වර්ග

නියද ,හණ

- විවීමේදී ගන්නා කොළ විවිධ ලෙස වර්ණ ගන්වා ගැනීම සිදුවේ. ඒ සඳහා වර්තමානයේ කුකුල් සායම් භාවිතා කරන අතර අතීතයේ පහත සඳහන් ලෙස වර්ණ සාදාගෙන තිබේ.

රතු- පතිගි දැව හා කොරකන කොළ

කහ- වෙනිවැල් ගැට හෝ අමුකහ

කොළ - කනේරු කොළ, ලුණුමිදැල්ල, කැලෑ කොහොඹ

කළු - අරළු,බුළු කොටා තම්බා ගැනීම.


හණ පත්‍රවලින් කෙඳි ලබා ගැනීම



හණ කෙඳිවලින් කළාල විවීම

- දුම්බර පැදුරු හෙවත් කළාල ප්‍රධාන කොටස් තුනකි.

1. පන්නම් කළාල ( සාමාන්‍ය පැදුරු )

2. වැඩ කළාල ( මිශ්‍ර සැරසිලි සහිත පැදුරු )
3. කුරුලු කළාල ( කුරුලු හැඩ සහිත පැදුරු )





විවීමට හැකි වෙනත් නිර්මාණ :





වට්ටි, පෙට්ටි, මලු, අත් බෑග , හෑන් බෑග, හැදි ආන, උඩහල්ල, බත් මල්ල හා අලංකාරය සඳහා වෙනත් නිර්මාණ ද තිබේ.

පන් කර්මාන්තය ශ්‍රීලංකාවේ සෑම ප්‍රදේශයකම පැවති බව සඳහන් වේ

- ❖ පන් කර්මාන්තයේ නියැලෙන අය හඳුන්වන්නේ " කින්නර " නමිනි.
- ❖ පැදුරු විවීම සඳහා යොදන රටා වර්ග


තනිපට ලණුව, දෙපට ලණුව, කඳුරු මල, වංකගිරිය, තාරකාපෙත්ත, අලියා ,කුරුල්ලා , නයිපෙණය, මුවා, මකුළු රටාව

මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේනෙයි , කල්ලාරු, කන්තක්කුඩි, එරාවූර්, යන ප්‍රදේශ පැදුරු කලාවට ප්‍රසිද්ධ වේ.

එහි ප්‍රධාන රටා වර්ග දෙකකි.

1.ඔන්ඩිප්පායි.(ජ්‍යාමිතික රටා)

2.පුනිප්පායි.(සමාන්තර රටා)







දිලානි අලුත්ගෙදර- ර/ හෝප්වෙල් විද්‍යාලය